www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා සමාජවාදී ඉදිරිදර්ශනයක්

**A socialist perspective to defend Sri Lankan university workers**

**සමාජවාදී සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සහ සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**

**2007 ජූනි 11**

*ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජවාදී සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) අද දින කොලඹ ප්‍රදේශයේ විශ්වවිද්‍යාල තුල පහත ප්‍රකාශයේ පිටපත් ඉංග්‍රීසි, දෙමල හා සිංහල භාෂාවන්ගෙන් බෙදා හරී.*

එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවේ සහ විශ්වවිද්‍යාල බලධාරීන්ගේ දන්ඩන ක්‍රියාමාර්ගවලට එරෙහිව දස දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල කම්කරුවෝ අරගලයක නිරතව සිටිති. වර්ජනයක යෙදීම හේතු කොට ගෙන පනවා ඇති වැටුප් කප්පාදුවක් ඉවත් කර ගන්නා ලෙසත් කොලඹ විශ්වවිද්‍යාලයේ වැඩ තහනමට ලක් කර ඇති කම්කරුවන් යලි සේවයේ පිහිටුවන ලෙසත් ඔවුහු ඉල්ලා සිටිති.

රටේ විශ්වවිද්‍යාල 15ම අනධ්‍යන සේවකයෝ මෙම ඉල්ලීම් වෙනුවෙන් ජූනි 4 දා එක් දින වැඩ නතර කිරීමක නිරත වූහ. විශ්වවිද්‍යාල භාර පරිපාලන අධිකාරිය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ (යූජීසී) කාර්යාලය ඉදිරියේ දහස් ගනනක් පිකට් උද්ඝෝෂනයක යෙදුනහ. කොලඹ විශ්වවිද්‍යාල කම්කරුවන් සිය වැඩ වැරුම දිගට ම ගෙන ගිය අතර කම්කරුවන්ගේ වෛරය පුපුරා ඒම පාලනය කිරීමේ උත්සාහයක් ලෙස, සමිති නායකයෝ ජූනි 11 දා සිට අඛන්ඩ වර්ජනයක් කැඳවීමට පොරොන්දු වූහ. කෙසේ වෙතත්. පසුගිය සිකුරාදා, උද්ඝෝෂනය දිගටම ගෙනයාමක් හා අනාගත විරෝධතා පිලිබඳ පොරොන්දුවක් පමනක් දෙමින්, කොලඹ විශ්වවිද්‍යාලයේ වර්ජනය ඇතුලු සමස්ත කාර්මික ක්‍රියාවන් ම නතර කිරීමට සමිති ක්‍රියා කලහ.

තම වෘත්තීය සමිති විසින් පාවා දෙනු ලැබ ඇති විශ්වවිද්‍යාල කම්කරුවන්ට සහයෝගය දෙන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) වැඩ කරන ජනතාව වෙත කැඳවුම් කර සිටී. පරදුවට තැබී ඇත්තේ, වර්ජනය කිරීමේ අයිතිය ඇතුලු මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් මෙන් ම රැකියා. මහජන අධ්‍යාපනය හා ජීවන මට්ටම් ආරක්ෂා කර ගැනීම යි. විශ්වවිද්‍යාල සේවකයන්ට එරෙහි ප්‍රහාරය, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යලි අවුලුවනු ලැබ ඇති වර්ගවාදී යුද්ධයේ බර කම්කරු පන්තිය මත හෙලීමට ආන්ඩුව දරන ප්‍රයත්නයේ ඒකාග්‍ර කොටසකි.

වැටුප් විෂමතා විසඳීම, 2006 අයවැයෙන් නිවේදනය කල වැටුප් වැඩිවීම ලබා දීම සහ මාසික වන්දි දීමනාවේ හිඟ මුදල් ගෙවීම යන ඉල්ලීම් මත දිවයින පුරා විශ්වවිද්‍යාල කම්කරුවෝ අප්‍රේල් 24 දා අඛන්ඩ වර්ජනයක් දියත් කලහ. අන්තර් විශ්වවිද්‍යාල වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව (අවිවෘසඒක), හිඟ වැටුප්වලින් කුඩා කොටසක් පමනක් ගෙවීමට ආන්ඩුව දුන් පොරොන්දුවක් පිලිගෙන මැයි 7 දා වර්ජනය නතර කලේ ය.

වර්ජනය අවසන් වීමත් සමග ම. කම්කරුවන් වර්ජනයේ යෙදුන දින ගනන වෙනුවෙන් එක්කෝ වැටුප් කප්පාදුවකට නැති නම් නිවාඩු කප්පාදුවකට එකඟ විය යුතු යැයි අවධාරනය කරමින්, යූජීසීය වහාම ප්‍රහාරාත්මක පියවරකට එලඹුනි. පෙර නොවූ විරූ දන්ඩනයන්ට හා සිය මාසික වැටුප ගෙවීම ප්‍රමාද කිරීමට විරෝධය දක්වමින් කොලඹ විශ්වවිද්‍යාල කම්කරුවන් වැඩ නතර කල විට මැයි 28 දා සමිති ක්‍රියාකාරින් නව දෙනෙක් වැඩ තහනමට ලක් කෙරුනි. විශ්වවිද්‍යාල බලධාරිහු හොරන ශ්‍රී පාලි මන්ඩපයේ කම්කරුවන් අට දෙනෙකු බලාත්කාරයෙන් මාරු කොට අනාගත වර්ජනවලට ද වැටුප් කප්පාදු පැනවෙන බවට අනතුරු ඇඟවූහ.

මෙම දන්ඩන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් "දුෂ්ට" විශ්වවිද්‍යාල පරිපාලකයන්ට බැන වැදීමට සමිති නායකයන් උත්සාහ කර ඇති නමුදු ඒ සඳහා මූලිකව ම වගකිව යුත්තේ එජනිස ආන්ඩුව යි. 2005 නොවැම්බර් ජනාධිපතිවරනයෙන් යන්තම් ජය ගත් ජනාධිපති මහින්ද රාජපක්ෂ ජීවන මට්ටම් කඩා වැටීම අරබයා වැඩෙන මහජන අසහනයට ප්‍රතිචාර දක්වා ඇත්තේ කම්කරු පන්තිය භේද කරනු පිනිස දෙමල

විරෝධී ස්වෝත්තමවාදය ඇවිලවීම සහ දිවයින යලි සිවිල් යුද්ධය කරා ඇද දැමීම මගිනි. දැන් "ජාතික ආරක්ෂාවේ" නාමයෙන්, ඔහුගේ ආන්ඩුව මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් රුදුරු ලෙස පාගා දමමින් සිය පිලිවෙත්වලට විරුද්ධ වන ඕනෑම අයකු ද්‍රෝහියකු ලෙස හංවඩු ගසමින් සිටී.

එල්ටීටීඊයට එරෙහි යුද්ධය හේතු කොට ගෙන රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීමක් සිදු කිරීමට ආන්ඩුවට නොහැකි යැයි මැයි 25 දා සිය තිල නිවහනේ පැවති සමිති නායකයන්ගේ රැස්වීමක දී රාජපක්ෂ කෙලින් ම පැවසී ය. "ප්‍රභාකරන්ට සේවය" කරන්නන් ලෙස ඔහු ආන්ඩුවේ විවේචකයන් හෙලා දුටුවේ ය. එහි සිටි කිසිදු සමිති නිලධරයෙක් ජනාධිපතිට අභියෝග කලේ නැත. ඒ මක් නිසා ද කිය තොත්, ඒ හෝ මේ ආකාරයෙන්, ඔවුන් රාජපක්ෂ ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට සහයෝගය දෙන බැවිනි.

වැඩ කරන ජනතාවට -- සිංහල, දෙමල හා මුස්ලිම් -- මෙම සිත් පිත් නැති සාපරාධී ගැටුමේ බර දැරීමට බල කරනු ලැබ ඇත. පසුගිය 18 මසක කාලය තුල සිය ගනනක් මරා දමා. ඊටත් වැඩි ප්‍රමානයක් "අතුරුදහන්" කෙරී දස දහස් ගනනක් සිය නිවාසවලින් පලවා හරිනු ලැබ තිබේ. ආන්ඩුව පසුගිය වසරේ යුද වියදම් සියයට 25කින් නාටකාකාර ලෙස ඉහල දමා මේ වසරේ එය තව දුරටත් සියයට 45කින් වැඩි කිරීමට තීන්දු කර ඇත. 2007 වසර සඳහා යුද අයවැය රුපියල් බිලියන 139ක් (එක්සත් ජනපද ඩොලර් බිලියන 13), එනම් ආන්ඩුවේ මුලු වියදමෙන් සියයට 30.3ක් වෙතැයි බලාපොරොත්තු වේ.

පුද්ගලීකරනය හා වෙලඳ පොල ප්‍රතිසංස්කරන පිලිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ඉල්ලීම් ක්‍රියාවට දැමීම දිගටම සිදු කරන අතරතුර සිය යුද්ධය සඳහා මුදල් සොයා ගනු වස් මහජන සේවාවන් කප්පාදු කිරීමට රාජපක්ෂ ක්‍රියා කොට තිබේ. විශ්වවිද්‍යාල ඇතුලු සෑම මට්ටමක ම මහජන අධ්‍යාපනය මෙන් ම සෞඛ්‍ය සේවාව හා සුභසාධන මෙම කප්පාදුවට හසුව තිබේ. යුද වියදම් උද්ධමනය වේගවත් කොට තිබේ. මූලික භාන්ඩවල මිල ගනන් ඉහල යාම මූර්ත වැටුප් කප්පාදුවට ලක් කොට ඇත.

වර්ජන හා විරෝධතාවලට ප්‍රතිචාර වසයෙන්, ආන්ඩුව පවත්නා හදිසි නීතිය යටතේ සිය මර්දන බලතල වැඩි වැඩියෙන් යොදා ගෙන තිබේ. පසුගිය දෙසැම්බරයේ දී පන් ලක්ෂයක් වන වතු කම්කරුවන්ගේ වර්ජනයක් ඉස්මත්තේ දී රාජපක්ෂ රුදුරු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පීටීඒ) යලි පනවා අත්‍යවශ්‍ය සේවාවන්ට "බාධා කිරීමේ" ඕනෑම පියවරක් "ත්‍රස්තවාදී ක්‍රියාවක්" ලෙස හංවඩු ගැසී ය. වරාය කම්කරුවන්. වතු කම්කරුවන් සහ දැන් විශ්වවිද්‍යාල සේවකයන් ද්‍රෝහීන් ලෙස සලකා ඒ අනුව ක්‍රියා කරනු ලැබේ.

යුද්ධයට, එය ගෙන යන ආන්ඩුවට හා ඒ සඳහා වගකිව යුතු ලාභ ගරන පද්ධතියට විරුද්ධ දේශපාලන ක්‍රියාමාර්ගයකින් තොරව වැටුප්, සේවා කොන්දේසි හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් වෙනුවෙන් අරගලයක් ගෙන යාමට කම්කරු පන්තියේ කිසිදු කොටසකට නොහැකි වනු ඇත. පාලක ප්‍රභූවේ සියලු කන්ඩායම්වලින් ස්වාධීනව කම්කරුවන් බලමුලු ගැන්වීමේ සමාජවාදී ඉදිරිදර්ශනයක් කම්කරු පන්තියේ අති මූලික අවශ්‍යතා පවා ආරක්ෂා කර ගැනීමේ අත්‍යවශ්‍ය පූර්ව-කොන්දේසිය යි. වෘත්තීය සමිති නායකත්වය එවන් අරගලයක් ගෙන යාමෙහි ලා ඓන්ද්‍රීයව ම අපොහොසත් ය.

විශ්වවිද්‍යාල වෘත්තීය සමිති සන්ධානය ඒ පිලිබඳ මනා නිදසුනකි. අවිවෘසජ්ක සමන්විත වන්නේ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) අනුබද්ධිත ශ්‍රී ලංකා නිදහස් සේවක ඒකාබද්ධ බල මන්ඩලය, යුද-ගැති ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) විසින් පාලනය කෙරෙන අන්තර් විශ්වවිද්‍යාල සේවා වෘත්තීය සමිතිය (අවිසේවෘස) සහ "ස්වාධීන" සමිති ගනනාවකිනි. එම "ස්වාධීන" සමිතිවල කැපී පෙනෙන ලක්ෂනය වන්නේ කිසිදු ස්වාධීන ආස්ථානයක් ගැනීමට ඒවාට ඇති නොහැකියාව යි.

ආරම්භයේ පටන් ම, අන්තර් විශ්වවිද්‍යාල වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුවේ ඉදිරිදර්ශනය සීමා වූයේ විශ්වවිද්‍යාල බලධාරින්ට, යූජීසීයට හා රාජපක්ෂ ආන්ඩුවට නිරර්ථක ආයාචනා ඉදිරිපත් කිරීමට පමනි. මැයි 7 දා වර්ජනය නතර කිරීමේ දී අවිවෘසජ්ක සම ලේකම් එච්.පී. ආරියපාල ප්‍රකාශ කලේ, "ආන්ඩුවේ මූල්‍ය තත්වය හා සෙසු දුෂ්කරතා සැලකිල්ලට ගත් කල" සමිතිවලට වෙනත් විකල්පයක් නැති බව යි. පසුගිය සිකුරාදා සියලු වර්ජන ක්‍රියාමාර්ගය නතර කිරීමේ දී සමාවට කරුන ලෙස අවිවෘසජ්ක නායකයන් ඉදිරිපත් කලේ ද එම හේතුව යි. එනම්, "රටේ පවතින තත්වය" යි. "පවතින තත්වය" යනු රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධය මිස අන් කිසිවක් නොවේ.

ජවිපෙට අනුබද්ධිත සෙසු සමිතිවල මෙන් ම අන්තර් විශ්වවිද්‍යාල සේවා වෘත්තීය සමිතියේ සටන්කාමී හඬ නගන පූච්චානම් ද පදනම්ව ඇත්තේ බොරු මත ය. එක අතකින්, අවිසේවෘස නායකයෝ කම්කරුවන්ගේ ආරක්ෂකයන් ලෙස වාචාල සහගත මවාපෑමක් කරමින් රාජපක්ෂ ඔවුන්ගේ වැටුප් වැඩි කිරීමට පියවර ගත යුතු යැයි ඉල්ලමින් උද්සෝෂනයක් දියත් කර තිබේ. අනෙක් අතට, එල්ටීටීඊයේ විනාශය වෙනුවෙන් පෙනී සිටින වඩාත්ම සෝෂාකාරී උද්සෝෂකයන් වන ජවිපෙ ඉල්ලා සිටින්නේ රාජපක්ෂ යුද්ධය "නිවැරදිව මෙහෙයවා" එය උත්සන්න කල යුතු බව සහ කම්කරුවන් "මව්බිම පලමුවී" තැබීමට කැප කල යුතු බව යි. තිරයට පිටුපසින්, ජවිපෙ පාලනයට යටතේ පවතින අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලයේ (අවිශිබම) නායකයන් අන්තර්

විශ්වවිද්‍යාල වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුවෙන් ඉල්ලා සිටියේ, යලිදු වරක් "පවත්නා තත්වය" හොඳ නැත යන පදනම මත. කාර්මික ක්‍රියාව නතර කරන ලෙස යි.

ඕනෑම වර්ජනයක දී හෝ විරෝධතාවක දී කම්කරුවන්ගේ සටන් කාහල නාදය විය යුත්තේ, මෙම හාතෘහාරක යුද්ධයට එක මිනිසෙක්. එක සතයක් නොදෙනු යන්න යි. දිවයින පුරා විශ්වවිද්‍යාල කම්කරුවන් ඒකාබද්ධ වූ මෑත වර්ජනයේ දී දක්නට ලැබුනු අයුරු, දෙමල වේවා, සිංහල වේවා මුස්ලිම් වේවා, වැඩ කරන ජනතාව පොදු පන්ති අවශ්‍යතා, උවමනාකම් හා අභිලාෂයන් බෙදා හදා ගනිති. කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයක් සඳහා ආරම්භක පියවර වන්නේ සෑම ආකාරයක ම ජාතිකවාදය හා වර්ගවාදය -- කොලඹ දේශපාලන සංස්ථාපිතයේ සිංහල ස්වෝත්තමවාදය හා එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය යන දෙක ම -- ප්‍රතික්ෂේප කිරීම යි.

ජනගහනයේ අති මහත් බහුතරය වන වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා, වඩා වැඩි ලාභ වෙනුවෙන් සංගත ප්‍රභූව කරන ඉල්ලීම්වලට ඉහලින් තැබිය යුතු ය. ශිෂ්ඨ සම්පන්න ජීවන වේතනයක් සපයනු පිනිස වැටුප් ඉහල දමා ඒවා ජීවන වියදම් දර්ශකයට අනුරූප කල යුතු යැයි සසප ඉල්ලා සිටී. සියල්ලන් සඳහා දැරිය හැකි ඉහල ගුනාත්මක සේවා සපයනු පිනිස මහජන අධ්‍යාපනය මෙන් ම සෞඛ්‍ය සේවාව, සුබසාධන. ප්‍රවාහනය හා නිවාස පහසුකම් වර්ධනය කල යුතු ය. අත්‍යවශ්‍ය සේවා නියෝග, පීටීඒ හා වර්ජනය කිරීමේ අයිතිය මත පැනවෙන සීමාවන් ඇතුලු සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති වහාම අහෝසි කල යුතු යැයි සසප කියා සිටී.

24 වසරක යුද්ධය අවසන් කිරීමේ එක ම මාවත වැටී ඇත්තේ එය ක්‍රියාවට දැමීම වෙනුවෙන් වගකිව යුතු ආන්ඩුවට හා පක්ෂවලට -- පාලක ශ්‍රීලනිපයට, විපාර්ශ්වික එජාපයට හා එම පක්ෂ වටා එල්ලී සිටින සෙසු සියලු සංවිධානවලට -- එරෙහිව කම්කරුවන් ගෙන යන දේශපාලන අරගලයක් හරහා ය. කම්කරු පන්තියට ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමය ගැන කිසිදු විශ්වාසයක් තැබිය නොහැකි ය. එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා ජපානය ඇතුලු සාම ක්‍රියාදාමයේ ප්‍රධාන අනුග්‍රාහකයන් සියල්ලෝ ම ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද නව-විජිතවාදී මිලිටරි වාඩිලෑමේ කොටස්කරුවන්ව සිටිති. ශ්‍රී ලංකාවේ සාමයට සහාය දෙන බවට කියාපාන අතර ම, එම බලවතුන් රාජපක්ෂගේ ආක්‍රමනික මිලිටරි මෙහෙයුම්වලට නිහඬ සහයෝගය දී ඇත.

කම්කරුවෝ යුද්ධය නතර කිරීමේ ස්වකීය මූලෝපාය ඉදිරිපත් කල යුත්තාහ. ප්‍රථම ඉල්ලීම විය යුත්තේ උතුරේ හා නැගෙනහිර මිලිටරි වාඩිලෑම වහාම හා කොන්දේසි විරහිතව අවසන් කිරීම සහ එම ප්‍රදේශවලින් සියලු ආරක්ෂක හමුදාවන් ඉවත් කර ගැනීම යි. රටේ ධනවත් ප්‍රභූන්ගේ අවශ්‍යතා නියෝජනය කරන රාජපක්ෂ ආන්ඩුවට එරෙහිව, සමාජවාදී පිලිවෙත්වලින් සමන්විත වැඩපිලිවෙලක් ක්‍රියාවට දමන කම්කරු-ගොවි ආන්ඩුවක් ගොඩනගන ලෙස සසප කැඳවුම් කර සිටී. ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලය දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා වන කම්කරු පන්තියේ වඩා පුලුල් අරගලයක කොටසක් විය යුතු ය.

මෙම ජාත්‍යන්තරවාදී හා සමාජවාදී ඉදිරිදර්ශනය සඳහා සටන් වදිනු පිනිස කම්කරු පන්තියේ නව මහජන පක්ෂයක් ගොඩනැගිම අවශ්‍ය ය. මෙම පිලිවෙත්වලට එකඟ වන සියල්ලන්ගෙන් ම අප ඉල්ලා සිටින්නේ අපගේ දේශපාලන ක්‍රියාමාර්ගය පිලිබඳ බැරෑරුම් අධ්‍යයනයක් සිදු කොට, ලෝක සමාජවාදී වෙබ් අඩවිය නිතිපතා කියවා, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සසපට බැඳී එය ගොඩනැගීමට එක් වන ලෙස යි.

© www.wsws.org